**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**
උපදේශක චක්‍රලේඛය 2004/පුස/02 (අ)(සංශෝධිත 2026)

**සංස්කෘතික මධ්‍යස්ථාන පුස්තකාලයන්හි**
**"ඔක්තෝබර් - ජාතික කියවීමේ මාසය වැඩසටහන" ක්‍රියාත්මක කිරීම**

## 01. හැඳින්වීම

2004 වසරේ සිට සෑම වර්ෂයකම ඔක්තෝබර් මාසය ජාතික කියවීමේ මාසය ලෙස රජය මගින් ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව 2026 ඔක්තෝබර් මාසයට යෙදෙන ජාතික කියවීමේ මාසයට සමගාමීව කියවීම ප්‍රවර්ධනය සඳහා **විශේෂ** වැඩසටහන් සහ **විශේෂ** ව්‍යාපෘති ක්‍රියාත්මක කරන මෙන් සියලුම සංස්කෘතික මධ්‍යස්ථාන පුස්තකාලවලින් ඉල්ලා සිටිනු ලැබේ.“ **දිවි ඇතිතුරු- අකුරු මිතුරු”** යන තේමාව පදනම් කරගනිමින් මෙම වසරේ ජාතික කියවීමේ මාසය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නියමිත ය .

## 02. කියවීම

"කියවීම" යන්නෙන් හැඟී යන පොදු වාච්‍යාර්ථය ලෙස පොත්පත් කියවීම සැලකේ. නමුත් කියවීම යනු එයට වඩා පුළුල් අර්ථකථනයක් ලබාදිය හැකි ක්‍රියාවලියකි. ඒ යටතට තොරතුරු අවශ්‍යතා, දැනුම, රසවින්දනය,පර්යේෂණ කාර්යයන් සඳහා පොත්පත් වැනි මුද්‍රිත මාධ්‍ය හරහා කියවීම මෙන්ම මාර්ගගත, විද්‍යුත්, ශ්‍රව්‍ය දෘශ්‍ය යන මාධ්‍ය හරහා කියවීම ද ගැනේ. විවෘත මනසකින් නාට්‍යයක් රසවිඳීම,සොබාදහම විඳීම නිරීක්ෂණය ද එක්තරා කියවීමකි. කියවීම තුළින් දැනුමෙන් මෙන්ම පරිකල්පන ශක්තියෙන් නිර්මාණශීලීභාවයෙන්,විචක්ෂණශීලිත්වයෙන්, සංවේදීතාවයෙන් ,රසඥතාවයෙන් යුත් පුද්ගලයන්ගෙන් සැදුම්ලත් සමාජයක් බිහිවීම සඳහා ලැබෙනුයේ විශාල පිටුබලයකි.

දැනට දශක කිපයක සිට තනිපුද්ගලයෙකු වශයෙන් මෙන්ම සමාජයක් වශයෙන්ද කියවීමේ පුරුද්ද දුරස්ථ වෙමින් පවතී. පුද්ගල ජීවිතයට කුමන හෝ අංශයෙන් වටිනාකමක් එක්කෙරෙන යහපත් වූ කියවීම වෙනුවට නූතන සන්නිවේදන තාක්ෂණය හරහා සිදු කෙරෙන ජනප්‍රිය රැල්ලේ ක්ෂණික මතුපිට කියවීම වෙත නැඹුරුවීම මෙන්ම ඇබ්බැහිවීමද අද වන විට සමාජ ප්‍රගමනයට අහිතකර බලපෑම් එල්ල කර තිබේ. රටක් වශයෙන් පූර්ණ සංවර්ධනය කරා යන ගමනේදී දැනුම කේන්ද්‍රිය,සබුද්ධික,සංස්කෘතික සමාජයක් ගොඩ නැංවීම සඳහා කියවීම ඵලදායී හා අර්ථාන්විතව යොදා ගැනීම ඉතා වැදගත්ය.

## 03. ව්‍යාපෘති කමිටුව

මෙහිදී වැඩසටහන් සංවිධානය කිරීම සඳහා විවිධ අංශ නියෝජනය වන පරිදි ජාතික කියවීමේ මාසයේ ව්‍යාපෘති කමිටුවක් පත් කර ගැනීම වඩා සුදුසු වේ. දැනට පුස්තකාල කමිටුවක් තිබේ නම් එම කමිටුව මඟින් හා පාඨක සමාජයේ සහභාගිත්වයෙන් මෙම කටයුත්ත සිදු කළ හැක. මේ සඳහා ප්‍රධාන මෙහෙයුම් කමිටුවක් පත්කර ගැනීම ද සුදුසු වන අතර එහි සංයුතිය පහත පරිදි විය යුතුය.

- ස්ථාන භාරනිලධාරි - කමිටු සභාපති
- පුස්තකාල භාරකරු - කමිටු ලේකම්
- පාඨක සමාජයේ සාමාජිකයන් දෙදෙනෙක්

## 04. ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන්

පුස්තකාලයක ප්‍රධාන කාර්යභාරය වන්නේ කියවීම හා සම්බන්ධ සේවා සාර්ථකව පවත්වාගෙනයාම වේ. ඒ යටතේ පුස්තකාලයක් විසින් ඉටුකරනු ලබන දෛනික කාර්යයන්ට සමගාමීව හා අමතරව පහත දක්වා ඇති කාර්යයන් ඉටු කිරීම,ප්‍රවර්ධනය කිරීම යෝජනා කෙරේ.

- කියවීම ප්‍රවර්ධනය සඳහා වෙබ් පිටුවක් නිර්මාණය කිරීම.
- අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය භාවිතයෙන් නිවැරදි තොරතුරු ගවේෂණය සම්බන්ධව පාඨකයා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
- පුස්තකාලය හා මෙතෙක් සම්බන්ධ වී නොමැති පාඨකයන් හඳුනා ගෙන ඔවුන් සම්බන්ධ කර ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පුස්තකාල සාමාජිකත්වය පිරිනැමීම.
- තොරතුරු සාක්ෂරතා වැඩසටහන් සංවිධානය කිරීම.
- ප්‍රජාවගේ රසවින්දනය ඉහළ නැංවීම සඳහා රසවින්දනාත්මක වැඩසටහන් සංවිධානය කිරීම.
- සාහිත්‍ය සම්මානලාභී කෘති ඇසුරින් තෝරා ගත් කෘති අළලා විවෘත රසවින්දන විචාර තරඟ/විවෘත චිත්‍ර තරඟ සංවිධාන කිරීම.
- "පොතකට වේලාවක්" පොතක් කියවීමට පාඨකයාට නියමිත දිනයක් සහ වේලාවක් ලබාදීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
- කියවීම් කඳවුරු පැවැත්වීම.
- "කියවමු - දිනමු" තේමාව යටතේ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් සංවිධානය කිරීම.
- හොඳම පාඨකයා තේරීමේ වැඩසටහන් / තරඟ සංවිධානය.
- පාඨකයන්ගේ නිර්මාණශීලී අදහස් පුස්තකාල බිත්ති පුවත්පත/සඟරා මගින් ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසීම.
- පෙර වර්ෂවලට සාපේක්ෂව එදිනෙදා පුස්තකාල පරිහරණය ඉහළ නැංවීම.
- වෙනත් නිර්මාණශීලී කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් සිදු කිරීම.
- වෙනත් සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 05. අරමුදල්

මේ සඳහා විශාල වශයෙන් මුදල් යෙදවීම් සිදු කිරීම අවශ්‍ය නොවේ. අවශ්‍ය අරමුදල් ආයතනයේ පොදු අරමුදල මගින් සිදු කළ හැකිය.

## 06. වාර්තාව සකස් කිරීම

සිදු කරන ලද සියලුම වැඩසටහන් පිළිබඳ පැහැදිලි ක්‍රමවත් වාර්තාවක් සකස් කර ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ***2027* පෙබරවාරි මස *28*** වන දින හෝ ඊට පෙර ***අංශ ප්‍රධාන, ව්‍යාප්ති සේවා අංශය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, අංක 14, නිදහස් මාවත, කොළඹ 07*** යන ලිපිනයට එවිය යුතුය.

ජයග්‍රාහී පුස්තකාල තෝරා ගැනීම සඳහා මූලිකව සලකා බලනු ලබන වාර්තාව සකස් කිරීමේදී, ඉහත දක්වන ලද වැඩසටහන් ඇතුළුව කියවීම් ප්‍රවර්ධනය සම්බන්ධයෙන් සිදුකරන ලද වැඩසටහන් සඳහා ප්‍රමුඛතාව ලබාදීමේ ක්‍රමවේදයක් අනුගමනය කරනු ලැබේ.සංස්කෘතික මධ්‍යස්ථාන පුස්තකාලයන්හි මේ සඳහා යෙදවිය හැකි ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති නම් සුදුසු පරිදි වැඩසටහන් කීපයක් හෝ ඉටු කරන මෙන් ඉල්ලමි.

වාර්තාව සකස් කිරීමේදී පිටකවරය /පොතේ බැම්ම වැනි දේ සඳහා අමතර කාලයක් හා මුදලක් වැය කිරීම අවශ්‍ය නොවේ. පුස්තකාලය විසින් ජාතික කියවීමේ මාසයේ තේමාවට අනුව සිදුකරන ලද වැඩසටහන් සහ අදාළ වර්ෂය පුරා සිදුකළ වැඩසටහන්වල තොරතුරු වෙන් වෙන්ව ඡායාරූප හා තහවුරු කළ හැකි වෙනත් සාධක / සංඛ්‍යාදත්ත සහිතව විධිමත් අයුරින් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.

## 07. ඇගයීම

ජාතික කියවීමේ මාසය 2026 එළදායි වැඩසටහන් ඉටු කළ සංස්කෘතික මධ්‍යස්ථාන පුස්තකාල අතරින් හොඳම සංස්කෘතික මධ්‍යස්ථාන පුස්තකාල වෙත 2027 ජාතික කියවීමේ මාසය සම්මාන ප්‍රදානෝත්සවයේ දී සම්මාන හා සහතිකපත් පිරිනැමීමට කටයුතු කරනු ලැබේ. ජයග්‍රාහී පුස්තකාල හා ඇගයීම් ලබන පුස්තකාල පිළිබඳ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

ආචාර්ය රත්න ශ්‍රී විජේසිංහ
සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
අංක 14, නිදහස් මාවත,
කොළඹ 07.

ආචාර්ය රත්න ශ්‍රී විජේසිංහ
සභාපති
විමසීම් - දුරකථන අංකය - 0112-688855
ෆැක්ස් - 0112-685201
විද්‍යුත් තැපැල - libdev@mail.natlib.lk
වෙබ් පිටුව - www.natlib.lk